# ලංසු සඳහා ආරාධනයයි

## පවිත්‍රතා සේවා සැපයීම

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## ප්‍රසම්පාදන අංක: MFA/AD/Proc/C&JS/2025-26

1. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය වෙනුවෙන් ලේකම් විසින් සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් එක් වසරක කාලයක් සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ පරිශ්‍රය සඳහා පවිත්‍රතා සේවා සැපයීම පිණිස මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. රජයේ හෝ පුද්ගලික අංශයේ ආයතන සඳහා පවිත්‍රතා සේවා සපයනු ලබන හා 250 කට වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබන ලංසුකරුවන් පවිත්‍රතා සේවා සැපයීම සඳහා සුදුසුකම් ලබති.

3. වෙළඳපොල මිළ සැඳහුම් ක්‍රමය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

4. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 2,000.00 ක් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ගිණුම් අංශය (10 වන මහළ, සෙලින්කෝ මන්දිරය, කොළඹ 01) වෙත ගෙවා ලදුපත ලබාගත යුතුය. ලදුපත ඉදිරිපත් කිරීමෙන් රාජකාරි දිනවල **2025 අගෝස්තු මස 28 දින දක්වා, පෙ.ව. 9.00 හා ප.ව. 3.00** අතර කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලේඛන කට්ටලයක් සාමාන්‍ය පාලන අංශය වෙතින් ලබාගත හැක.(. 01 වන මහළ,පරණ ටයිම්ස් ගොඩනැගිල්ල, කොළඹ 01)

5. මුද්‍රා තැබූ ලංසු ලේකම්, විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, 1 වන මහල, පරණ ටයිම්ස් ගොඩනැගිල්ල ,කොළඹ 01 යන ලිපිනයට **2025 අගෝස්තු 29 දින ප.ව. 2.00** ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ඉහත සඳහන් ලිපිනයේ දී පැමිණ සිටින ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

6. සියලුම ලංසු සමඟ, ලංසු ලේඛනයන්හි විස්තර සඳහන් පරිදි වූ රුපියල් 50,000 (පනස් දහසක්) වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

7. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 01, Old Times Building, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබාගත හැක.

දුරකතන /011-7711109

ලේකම්
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
ජනරජ ගොඩනැගිල්ල
කොළඹ 01.
2025 . 08 . 15